**ශීර්ෂය 130 - රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 07 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම
-------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව
--------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් හා තැපැල් දෙපාර්තමේන්තුවෙන් සමාලෝචිත වර්ෂයේදී එකතු කරන ලද එකතුව රු.22,258,705 ක ගොඩනැගිලි කුළී ආදායම්, රජයේ ගොඩනැගිලි හා නිවාස කුළි ආදායම් සංකේතයට බැර නොකිරීම හේතුවෙන් ගොඩනැගිලි කුලී ආදායම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.<br>කම්කරු දෙපාර්තමේන්තුව මඟින් එකතු කරන ලද සංචාරක බංගලා හා නිවාඩු නිකේතන ආදායම කොපමණද යන්න ගණනය කර එම ප්‍රමාණය ද ගිණුමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20 /2021 මඟින් රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී වලට අදාල සියලු ප්‍රභවයන්ගේ ආදායම් රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී (20.02.01.01) ආදායම් සංකේතාංකයට බැර කිරීමට කටයුතු කළ යුතු බව දන්වා ඇත. තැපැල් දෙපාර්තමේන්තුව, කම්කරු දෙපාර්තමේන්තුව වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් ශීර්ෂයට බැර කරන බව දන්වා ඇත. | රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී ආදායම් සංකේතයට බැරකල යුතු සියළු ආදායම් බැර කිරීමට කටයුතු කළ යුතු වීම. |

**1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය කාර්ය සාධන වාර්තාව අනුව වර්ෂය තුළ මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම් රු.379,872,930 ක් වූයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අවසාන ශේෂය රු.8,300,719,560 ක් යුතු විය. එසේ වුවද භාණ්ඩාගාර පොත් අනුව මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.8,282,093,941 ක් වූයෙන් රු. 18,625,619 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙය නිවැරදි කරන ලෙස රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇත. | නිවැරදි කිරීම් සිදු කර ගිණුම් යාවත්කාලීනව පවත්වා ගත යුතු වීම. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ..

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2015 ජූලි 22 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව ආදායම් ගණන් දීමේ නිළධාරියා විසින් ආදායම් නිවැරදිව පුරෝකතනය කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුව රු. 1,200,000,000 හා ශුද්ධ ආදායම රු.1,288,512,491 ක් වූයෙන් රු.88,512,491 ක වැඩිවීමක් විය. මෙම වැඩිවීමට covid-19 වසංගත තත්වය අඩුවීම හේතුවෙන් බංගලා හා නිවාඩු නිකේතන වෙන්කිරීම ඉහළයාම හේතුව ලෙස දක්වා තිබුණද, රු.මිලියන 1500 ක් වූ මූලික ඇස්තමේන්තුව රු.මිලියන 1,200 ක් ලෙස සංශෝධනය කිරීමට හේතුව ලෙස covid-19 වසංගතය හේතුවෙන් අපේක්ෂිත ආදායම ලැබීම අඩුවීම ලෙස දක්වා තිබුණි. | මූලික ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කිරීමට, Covid-19 හේතුවෙන් අපේක්ෂිත ආදායම අඩුවේ යැයි අපේක්ෂා කිරීම හේතුවිය. නමුත් 2021 වර්ෂයේ මැද භාගයෙන් පසුව Covid-19 වසංගත තත්වය තරමක් පහව යාමත් සමඟ සංචාරක බංගලා සහ නිවාඩු නිකේතන ආදායම් ඉහල යාම නිසා සංශෝධිත ආදායම් ඇස්තමේන්තු ආදායමට වඩා සත්‍ය ආදායම වැඩිවිය. | 2015 ජූලි 22 දිනැති අංක 01/2015 දරණ චක්‍රලේඛය ප්‍රකාරව ඇස්තමේන්තු සකස් කල යුතු වීම. |
| (ආ) 2020 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම රු.309,146,648 ක් විය. සමාලෝචිත වර්ෂයේ දී හිඟ ආදායමින් රු.78,652,447 ක් අය වී තිබුණ ද රු.92,352,532 ක හිඟ ආදායමක් වර්ෂය තුළදී එකතු වී තිබුණි. මෙය පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.6,489,129 ක වැඩිවීමකි. ඒ අනුව හිඟ ආදායම වසරක් පාසා වැඩිවීම පාලනය කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග ප්‍රමාණවත් වී නොතිබුණි. තවද 1993 ජූලි 21 දිනැති අංක 320 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපිය ප්‍රකාරව | හිඟ ආදායම් අයකිරීමට කඩිනමින් පියවර ගන්නා ලෙස අදාල ආයතන ප්‍රධානීන් සහ රේඛීය අමාත්‍යාංශ ලේකම්වරුන්ට දැනුම් දී ඇත. නිරන්තරව අධීක්ෂණය මඟින් හිඟ ආදායම අයකර ගැනීමට බලාපොරොත්තු වේ. | හිඟ ආදායම් අයකර ගැනීම කඩිනම් කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | හිඟ ආදායම් එකතු නොකිරීම හේතුවෙන් රජයට සිදු වූ පාඩුව සම්බන්ධව විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (ඇ) | හිඟහිටි ආදායමෙන් රු.188,666,723 ක් 2018 දෙසැම්බර් 31 දිනට පෙර පැවති ශේෂයක් වූ අතර එය මුළු හිඟහිටි ආදායමෙන් සියයට 58 ක ප්‍රතිශතයක් විය. මෙම හිඟ මුදලට අනුරූපීව වර්ෂය තුළ එකතු කිරීම් රු.14,602,703 ක් පමණක් වූයෙන් ඉතිරි හිඟ මුදල් අයකර ගැනීම අවිනිශ්චිතව පැවතිණි. | 2018.12.31 දිනට පෙර තිබූ හිඟ ආදායම අයකර ගැනීමට නොහැකි වීමට ගිවිසුම් ප්‍රකාරව කුලී ගෙවීම් පැහැර හැරීම, නිවාඩු නිකේතනයන්හි කුලී අයනොවීම, තක්සේරු කිරීම් වලදී ඇති වූ ගැටළු යනාදී කරුණු හේතු වී ඇති අතර හිඟ ආදායම් අයකිරීමට කඩිනමින් පියවර ගන්නා ලෙස අදාළ ආයතන ප්‍රධානීන්ට සහ රේඛීය අමාත්‍යාංශ ලේකම්කරුන්ට දැනුම් දී ඇත. | හිඟ ආදායම් අයකර ගැනීම හෝ නිරවුල් කර ගැනීම කඩිනම් කල යුතු වීම. |
| (ඈ) | හිඟ කුලී ආදායමෙන් රු.58,781,895ක් එනම් සියයට 31 ක් රජයේ බංගලා සහ ලොරිස් පටුමගේ නිවාස කුලිය වූ අතර සමාලෝචිත වර්ෂය තුළදී මෙම නිවාස හිඟ කුලී එකතු කිරීම රු.2,006,587 ක් පමණක් වූයෙන් එය ප්‍රතිශතයක් වශයෙන් සියයට 3 ක් විය. තවද මෙම හිඟ ශේෂයෙන් රු.7,915,908 ක් මැති ඇමතිවරුන් 92 ගෙන් අයවිය යුතුව තිබුණි. එයින් රු.5,191,050 ක් 2012 වර්ෂයේ සිට 2020 දක්වා ඇමතිවරුන් 72 දෙනෙකුගෙන් හිඟහිටි ශේෂයක් විය. | රජයේ බංගලා සහ ලෝරිස් නිවාස වල පදිංචිව සිටි රජයේ මැති ඇමතිවරුන්ගෙන් අයවිය යුතු හිඟ නිවාස කුලී කඩිනමින් නිරවුල් කරන ලෙස, ලිපි මඟින් දැනුවත් කිරීම් සිදුකර ඇති අතර, ඇතැම් මන්ත්‍රීවරුන් මියයාම, ඇතැම් මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික ලිපිනයන්වල කිසිවෙකු නොමැති නිසා ලිපි ආපසු පැමිණීම සහ දුරකතනවලට නිසිපරිදි ප්‍රතිචාර නොදැක්වීම හේතුවෙන් හිඟ නිවාස කුලිය අයකර ගැනීම ප්‍රමාද වී ඇත. ඇතැම් ඇමතිවරුන් කටයුතු කල අමාත්‍යාංශවලින් නිවාස කුලී අයකරගෙන ඇති බව හිටපු ඇමතිවරුන් දන්වා තිබුණද අමාත්‍යාංශයන් වෙනස් වී ඇති බැවින් තොරතුරු සොයා ගැනීමේදී ප්‍රමාදයන් පැණ නැගී ඇත. | හිඟ ආදායම් අයකර ගැනීම හෝ නිරවුල් කර ගැනීම කඩිනම් කල යුතු වීම. |
| (ඉ) | සමුළු නිවාස සහ කැප්පෙටිපොල නිවාස ලබාදුන් 97 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුදල රු.4,926,903ක් විය. එයින් 48 දෙනෙකුගෙන් රු.1,756,932 ක් 2012 වර්ෂයේ සිට 2020 වර්ෂය අතර කාල පරාසයකින් අයනොවී පවතින ශේෂයක් විය. තවද ජයවඩනගම නිවාසවල පදිංචිව සිටි 24 දෙනෙකුගෙන් සමාලෝචිත | ඇතැම් නිළධාරීන්ගෙන් අදාළ අමාත්‍යාංශ මඟින් නිවාස කුලී අයකර ඇති අතර එම වාර්තා අප වෙත එවා නොමැති බැවින් තොරතුරු යාවත්කාලීන කරගැනීමේ ප්‍රමාදයක් ඇතිවී ඇති නිසා හිඟ නිවාස කුලියක් පවතී. සමුළු සහ සාද නිවාස වල පදිංචිව සිටි නිළධාරීන්ගේන් අයවිය යුතු හිඟ කුලිය සම්බන්ධයෙන් ලිපි මඟින් හා දුරකතන මාර්ගයෙන් දැනුවත් කර ඇති අතර තවත් | හිඟ ආදායම් අයකර ගැනීම හෝ නිරවුල් කර ගැනීම කඩිනම් කල යුතු වීම. |

| | | |
|---|---|---|
| වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ශේෂය රු.9,043,845 ක් වූ අතර මෙයින් 21 දෙනෙකුගෙන් 2012 වර්ෂයේ සිට 2020 වර්ෂය අතර කාල පරාසයකින් අය නොවී පවතින ශේෂය රු.8,854,776 ක් විය. | නිළධාරීන් වෙත ලිපි මඟින් හා දුරකතන මාර්ගයෙන් දැනුවත් කරමින් කඩිනමින් හිඟ මුදල් නිරවුල් කර ගැනීමට කටයුතු කරමින් පවතී. | |

## 2.2 වියදම් කළමනාකරණය

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ප්‍රාග්ධන වැය විෂයයන් 7 ක හා පුනරාවර්තන වැය විෂයයන් 02 ක මුළු ප්‍රතිපාදනයම පිළිවෙලින් රු.85,900,000ක් හා රු.900,000 ක් වශයෙන් එකතුව රු.86,800,000ක් ඉතිරි කර තිබුණි. ඉන් ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් රු.85,150,000 ක් මාස 08ක කාලයක් තුල වියදම් නොකර රඳවාගෙන ඉතිරි කිරීමට හේතු ලෙස 2021 අගෝස්තු 28 දිනැති අංක □□/□□/07/□□/2021/163 දරන මුදල් අමාත්‍යාංශ ලිපිය මඟින් වියදම් අහුරා තැබීම ලෙස දක්වා තිබුණි. | Covid 19 වසංගතය හේතුවෙන් කාර්යාල වසා තිබීම නිසා වාහන වැඩිපුර ධාවනය නොවීමත්, අරපිරිමැසුම්දායක ලෙස වාහන නඩත්තු කිරීමත් නිසා විශාල ප්‍රමාණයේ වියදම් සිදු නොවීම හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. අමප/21/1596/304/134 හා 2021.09.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ මුදල් අමාත්‍යාංශයේ අංක □□/□□/07/□□/2021/163 හා 2021.08.28 දිනැති ලිපිය මඟින් රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධයෙන් දී ඇති උපදෙස් පරිදි හා 2021 විදේශ ගමන් වියදම් නොතිබූ බැවින් මෙම වැය විෂයන්හි අදාල ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | මු.රෙ.50(ii) ප්‍රකාර ඇස්තමේන්තු සකස් කල යුතු වීම. |
| (ආ) | ප්‍රාග්ධන වැය විෂයයන් 17 කට හා පුනරාවර්තන වැය විෂයයන් 23 කට අදාළව මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,278,727,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම වැය විෂයයන්ට අදාළ මුළු වියදම රු.620,262,014 ක් විය. ඒ අනුව ඉතිරිය රු.658,464,986 ක් වූ අතර එය සියයට 16 සිට සියයට 96 දක්වා පරාසයක් ගෙන තිබුණි. | රාජ්‍ය වියදම් සමාලෝචනය අනුව ප්‍රතිපාදන අවුරා තැබීමත්, □□□□□ 19 වසංගතය තත්වයෙන් එල්ල වූ බලපෑම් මත දැරීමට අපේක්ෂිත මෙහෙයුම් වියදම් අනපේක්ෂිත ලෙස නොදැරීමත් මත ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | -එම- |

2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 94 (1) විධිවිධානවලට පටහැනිව වැය විෂයයන් 13ක ඉතිරිය ඉක්මවා රු.2,220,029 ක බැරකම් සඳහා එලඹී තිබුණි. | ඉදිරියේදී මෙම තත්ත්ව වළක්වාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව . | මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කල යුතු වීම. |
| (ආ) | බැරකම් ලෙස සිගාස් වැඩසටහනේ දක්වා තිබූ රු. 908,230,776 ක්, මූල්‍ය ප්‍රකාශනයේ බැරකම් ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණු අතර, මූල්‍ය ප්‍රකාශනයේ බැදීම් හා බැරකම් ප්‍රකාශයේ දක්වා තිබුණු රු. 26,815,177 ක බැරකම්, සිගාස් වැඩසටහනේ දක්වා නොතිබුණි. | සිගාස් වැඩසටහනේ දක්වා ඇති 908,230,776.26 ක් වටිනා බැරකම් මෙම වර්ෂයට අදාළ නොවන බවත් පෙර වර්ෂයන්ට අදාළ බැරකම් බවත් තාක්‍ෂණික දෝෂයන් මත ඒවා පෙන්නුම් කරන බැවින් ඉදිරියේදී එම දෝෂයන් නිවැරදි කිරීමටත් කටයුතු කර ඇත. | බැරකම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වීම. |

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ | | | |
| (i) | 4.1 වගන්තිය | තනිකඩ නිළධාරියෙකුට රජයේ නිවාස ලැබීමට අවස්ථාව සැලසිය හැකි වුවත්, පොරොත්තු ලේඛනයේ නිලධාරීන් 500 කට වැඩි ප්‍රමාණයක් නිවාස ඉල්ලුම්කර තිබියදී අවිවාහක නිලධාරිනියකට 2015 සැප්තැම්බර් 15 දින | නීති නිලධාරී තනතුර මෙම අමාත්‍යාංශයේ පවතින දෙපාර්තමේන්තුගත තනතුරක් වේ. එසේම මෙම නිලධාරිනිය වසර 10 ක් පුරා මෙම | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට යටත්ව කටයුතු කල යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | සිට නිවසක් වෙන් කරදී තිබුණි. | අමාත්‍යාංශයේ නීති නිලධාරී තනතුර දරන එකම නිලධාරිනිය ද වූ බැවින් සේවා අවශ්‍යතාවය සලකා සමුළු නිවස වෙන්කර දීමට අනුමැතිය ලබා දී ඇත. | |
| (ii) | 6.1 වගන්තිය | සියළුම නිවාසවල බදු කාලසීමාව වර්ෂ 5 ක් වුවද 2004 ජනවාරි 01 දින සිට මේ දක්වා එක් නිළධාරියෙකු වෙත සමුළු නිවාසයක් ලබා දී තිබුණි. 2010 ජනවාරි 01 දක්වා සහ 2011 ජනවාරි 01 දක්වා කාලය දීර්ඝ කිරීමෙන් අනතුරුව 2010 අගෝස්තු 23 දින සිදුකරන ලද ඉල්ලීමට අනුව සමුළු නිවාස කඩා ඉවත්කරන තුරු පදිංචිව සිටීමට ලබාදී තිබූ අවසරය පාවිච්චි කරමින් වර්ෂ 12 කට වැඩි කාලයක සිට නිවාසය භාවිතා කරමින් තිබුණි. | අදාළ නිවාස ව්‍යාපෘතිය මේ වන තෙක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් මෙම නිවස නැවත මෙම අමාත්‍යාංශයට භාරදෙන ලෙස දිගින් දිගටම දැනුම් දී ඇතත් භාරදීමට කටයුතු කර නොමැත. | නිවස ආපසු භාරනොදීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ දක්වා ඇති විධිවිධාන අනුගමනය කල යුතු වීම. |
| (iii) | 6.2 වගන්තිය | රජයේ නිවාසයක් වෙන්කර දියහැක්කේ රජයේ නිළධාරියෙකුට පමණි. එසේ වුවත් සමුළු නිවාස 2 ක් 1983 හා 2001 වර්ෂවලදී මාසිකව පිළිවෙලින් රු.275 ක සහ රු.1,000 ක කුලියකට ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයට ලබා දී තිබුණි. | මේ වන විට මෙම නිවාස දෙකෙහිම වර්තමාන මාසික නිදහස් වෙළඳපල කුලිය තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් කැඳවා ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |
| (iv) | 6.13 වගන්තිය | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරියෙකුට 2019 අගෝස්තු සිට 2022 ජූලි දක්වා විදේශ නිවාඩු ලබා දී තිබුණද, මෙම නිළධාරියා | එච්.ජේ.එන්.එස්. කුමාර මහතා සම්බන්ධයෙන් කරනු ලැබූ විමර්ශනයේ නිර්දේශ අනුව | ගෙන ඇති ක්‍රියාමාර්ග කඩිනම් කල යුතු වීම. |

| | | |
|---|---|---|
| | රජයේ නිවාසය ආපසු භාරදීමට කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 7.2 වන වගන්තිය අනුව 2022.02.03 දින සිට දණ්ඩන කුලියකට යටත් කිරීමට කටයුතු කර නෛතික ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 විදේශ ආධාර ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික භාෂා සමානාත්මතා ප්‍රවර්ධනය වැඩසටහන (NLEAP-Canadian) සඳහා සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුව මගින් 130-1-13-4-2509(13) යටතේ විදේශ ප්‍රදාන රු.80,000,000 ක් හා 130-1-13-4-2509(17) යටතේ දේශීය අරමුදලෙන් රු.4,500,000ක් වෙන්කර තිබුණද එම සම්පූර්ණ මුදලම ඉතිරිකර තිබූ අතර ඉතිරියට හේතු ලෙස වසංගතයේ බලපෑම ලෙස දක්වා තිබුණි. එසේ වුවද වර්ෂය තුළ දී මෙම වැඩසටහන යටතේ ලද විදේශ ප්‍රදාන කොපමණද යන්න සඳහා තොරතුරු ලබාගෙන ගිණුම් තැබීමක් සිදු කර නොමැති බැවින් මුළු මුදලම ඉතිරිවීම් ලෙස දැක්වීම නිවැරදි නොවිය. | 2022 අයවැය ඇස්තමේන්තුව තුළින් මේ සඳහා ප්‍රතිපාදන වෙන්කර නොමැති අතර, මෙම වැඩසටහනේ මූල්‍ය කැනඩා රජයේ ප්‍රදානයක් බවත් ලංකා රජයේ වැය ශීර්ෂ යටතේ කිසිදු වියදමක් දරා නොමැති බව. | ප්‍රදාන වශයෙන් ලද මුදල් ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කල යුතු වීම. |

3.2 වත්කම් කළමනාකරණය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මෝටර් වාහන වටිනාකම රු.525,065,471 ක් ලෙස දක්වා තිබුණද, ස්ථාවර වත්කම් ලේඛනයේ අමාත්‍යාංශය සතු වාහන වලින් වාහන 29 ක වටිනාකම රු.208,061,382 ක් පමණක් දක්වා තිබුණි. | ස්ථාවර වත්කම් ලේඛණයෙහි වටිනාකම දක්වා නොමැති වාහන 31 ඉදිරියේදි තක්සේරු කිරිමට අවශ්‍ය කටයුතු කරනු ලබන බව. | භාණ්ඩාගාර පොත්වල දක්වා ඇති වටිනාකම හඳුනාගෙන ඒ අනුව ස්ථාවර වත්කම් ලේඛණය සකස් කල යුතු වීම. |
| (ආ) | භාණ්ඩාගාර පොත්වලට අනුව සංචාරක බංගලා වටිනාකම රු.540,486,774 ක් ලෙස දක්වා තිබුණද එම වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. තවද සංචාරක බංගලා පිහිටි මහියංගනය, පොළොන්නරුව, මිහින්තලය, මුලතිව්, යාපනය, කතරගම හා මොනරාගල යන ඉඩම්වල අයිතිය අමාත්‍යාංශයට පවරා ගැනීමට නොහැකි වී තිබුණි. | අමාත්‍යාංශයට අයත් ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම පිළිබද තක්සේරු වාර්තාවක් ලබා දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමුකර ඇත. ඒ අනුව නිවැරදි කරන බව දන්වමි. නිවාඩු නිකේතන පිහිටි ඉඩම්වල අයිතිය මෙම අමාත්‍යාංශය වෙත පවරාගැනීමට අදාළ කටයුතු සිදුකරමින් පවතී. | භාණ්ඩාගාර පොත්වල දක්වා ඇති වටිනාකම හඳුනාගෙන ඒ අනුව ස්ථාවර වත්කම් ලේඛණය සකස් කල යුතු වීම. |

3.3 කළමනාකරණ දූර්වලතා

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය අනුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ මාස 03 ක් ඉක්ම යාමෙන් පසු පොත්වල නොපෙන්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 | මෙතෙක් පියවා නොමැති ශේෂ අයකරගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර අත්තිකාරම් ශේෂ නිරවුල් කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | දිනට එසේ නොකල ශේෂය රු.775,976 ක් විය. විගණිත දිනය වන විට තවදුරටත් අයවිය යුතු ශේෂය රු.503,678 ක් විය. | | |
| (ආ) | විවිධ හේතූන් මත සේවය අවසන් කල නිලධාරීන් 10 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ශේෂය රු.1,129,842 වූ අතර ඉන් රු.408,878 ක් වසර 05 ඉක්මවා තිබුණි. | අයවිය යුතු ශේෂ අය කර ගැනීමට අවශ්‍ය කටයුතු හා නීතිමය පියවර ගැනීම සිදු කරමින් පවතී. | ආයතන සංග්‍රහයේ □□□□ පරිච්ඡේදයේ 4.5 වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |
| (ඇ) | 2007 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලය තුල 8A දරන නිවසේ කිසිවෙකුට වෙන්කර දී නොමැති කාලය සඳහා රු.228,976 ක විදුලි බිලක් ලැබීම නිරවුල් කර නොතිබුණි. | අදාළ හිඟ විදුලි බිල කඩිනමින් නිරාකරණය කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන විදුලි ඉංජිනේරු කාර්යාලය වෙත දැනුම් දී ඇති අතර, 2022.05.05 නැවත සිහි කැඳවීමක්ද යොමුකර ඇත. | විදුලි බිල නිරවුල් කල යුතු වීම. |

4. මානව සම්පත් කළමනාකරණය
------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට කාර්යසාධන වාර්තාව අනුව ස්ථිර කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ 20ක් තෘතීය මට්ටමේ 8ක් ද්විතීක මට්ටමේ 124ක් හා ප්‍රාථමික මට්ටමේ 12 ක් වශයෙන් පුරප්පාඩු 164 ක් පැවතුණි. | මේ වන විට ඇතැම් පුරප්පාඩු සම්පූර්ණ කර ඇති බව හා අනෙක් තනතුරු සම්පූර්ණ කිරීම ඒ ඒ අංශවලින් සිදුකරන බව. | පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට හෝ සංශෝධනය කිරීමට කටයුතු කල යුතු වීම. |
| (ආ) | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් හා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරින් වසර 6 කට වඩා කාලයක් එකම ස්ථානයේ සේවයේ නියුක්ත කර තිබූ අතර එම නිළධාරීන් සංඛ්‍යාව පිළිවෙලින් 309ක් හා 173 ක් වී | ගණකාධිකාරි සේවයේ වසර 06කට වැඩි සේවා කාලයක් එකම සේවා ස්ථානයේ සිටින නිලධාරීන්ගෙන්, මුදල් අමාත්‍යාංශයේ සේවයේ නියුක්ත නිලධාරීන් 34 කි. ජනාධිපති හා අගමැති කාර්යාල වල සේවයේ | දීර්ඝ කාලයක් එකම ස්ථානයේ සේවය කරන නිළධාරීන් ස්ථාන මාරු කිරීමට ක්‍රියා මාර්ග ගත යුතු වීම. |

තිබුණි. එසේම ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය අනුව ජනාධිපති, අගමැති කාර්යාලවල, මුදල් අමාත්‍යාංශය සහ කොමිෂන් සභාවල නිළධාරීන් 47 දෙනෙකු ආයතන ප්‍රධානීන්ගේ එකඟතාවයකින් තොරව ස්ථාන මාරු කළ නොහැකි වී තිබුණි.

නියුක්ත නිලධාරීන් 08 කි. කොමිෂන් සභා වල සේවයේ නියුක්ත නිලධාරීන් 02 කි. රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/ 05-04/01/2019 හා 2021.04.09 දිනැති ලිපිය අනුව මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ එකඟතාවයකින් තොරව සිදුකල නොහැක.